**ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ (SEUDP) අදියර 1 බී ව්‍යාපෘතිය- 2015**

---

ශ්‍රී ලංකාවේ අග්නිදිග විශ්වවිද්‍යාලය සංවර්ධනය කිරීමේ අදියර 1 බී ව්‍යාපෘතියේ 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවෙට් අරමුදල අතර 2011 දෙසැම්බර් 20 දින එළඹි අංක 836 දරන ණය ගිවිසුම ප්‍රකාරව මෙම ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලැබේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

---

ව්‍යාපෘතියේ ණය ගිවිසුමට අනුව, එවකට උසස් අධ්‍යාපන අමාත්‍යාංශය, වර්තමානයේ උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ප්‍රාදේශීය හා ජාතික අවශ්‍යතා පිළිබිඹු වන පරිදි අම්පාර පිහිටි අග්නිදිග විශ්වවිද්‍යාලයේ උපාධි පාඨමාලා වල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම මෙන්ම සුදුසු අධ්‍යයන සංවර්ධන සැලැස්ම සංවර්ධනය කිරීම හා නව අවශ්‍යතාවයන්ට සරිලන උපාධි වැඩ සටහන් හඳුන්වාදීම මගින් ශිෂ්‍ය සංඛ්‍යාව වැඩි කිරීම හා ශ්‍රී ලංකාවේ සමාජ සංවර්ධනය හා ආර්ථික සංවර්ධනයට සහායවීම සඳහා ඉලක්ක කරන ලද එම විශ්වවිද්‍යාලය වැඩිදියුණු කිරීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු වේ. සංවර්ධන සැලැස්මෙන් නව පීඨ ගොඩනැඟිලි, පුස්තකාලයක් හා ඉගෙනුම් සම්පත් මධ්‍යස්ථානයක් ඉදිකිරීම, ශිෂ්‍ය හා ආචාර්ය මණ්ඩල නවාතැන් පහසුකම් සැපයීම හා දැනට වඩා ජලගැලීම් අවදානම් අඩු ප්‍රදේශවල ස්ථානගත වන ගොඩනැගිලිවල විනෝද හා සුභසාධන පහසුකම් සැපයීම සිදුකරනු ලැබේ. ණය ගිවිසුමට අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 1,660.05 කට සමාන කුවෙට් ඩිනාර් මිලියන 3.5 ක් විය. ඉන් රු.මිලියන 1,421.57 කට සමාන කුවෙට් ඩිනාර් මිලියන 3 ක් අරාබි ආර්ථික සංවර්ධනය සඳහා වූ කුවෙට් අරමුදල විසින් මූල්‍යයනය කිරීමට එකඟවී ඇත. ව්‍යාපෘතිය එහි කටයුතු 2012 සැප්තැම්බර් 01 දින ආරම්භ කළ අතර 2017 දෙසැම්බර් 31 දින වන විට අවසන් කිරීමට නියමිතය.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදි. ආචාරධර්මවල අවශ්‍යතාවයන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටින්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීමද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය

විගණක සැලකිල්ලට ගන්නා නමුත් ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උපදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි. පහත සඳහන් දෑ තක්සේරු කිරීමෙහිලා අවශ්‍ය යැයි සලකනු ලැබූ එවැනි පරීක්ෂා කිරීම්ද එම පරීක්ෂණයට ඇතුළත් විය.

(අ) අභ්‍යන්තර පාලන අංශයෙන් බලන කල ව්‍යාපෘති කළමනාකරණය පිළිබඳ සතුටුදායක පාලනයක් සහ ව්‍යාපෘතියේ මෙහෙයුම්වලට අදාළ පොත්පත්, වාර්තා ආදියේ විශ්වාසවන්තභාවය තහවුරු වනු පිණිස පද්ධති සහ පාලන ප්‍රමාණවත් වූයේද යන බව.

(ආ) ව්‍යාපෘතියේ මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන වියදම ව්‍යාපෘතිය විසින් පවත්වා ගෙන යන ලද වැඩිදියුණු කළ මූල්‍ය වාර්තා හා ප්‍රගති වාර්තා සමඟ සතුටුදායක ලෙස සසඳා තිබුණේද යන බව.

(ඇ) ණය යටතේ ආපසු ගැනීම් ණය ගිවිසුමේ දක්වා ඇති පිරිවිතරයන්ට අනුකූලව සිදුකර තිබුණේද යන බව.

(ඈ) ණය යටතේ සපයන ලද අරමුදල්, ද්‍රව්‍ය හා උපකරණ ව්‍යාපෘතියේ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණේද යන බව.

(ඉ) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදාගන්නා ලද වර්ගීකරණයට අනුව වියදම් නිවැරදිව හඳුනාගෙන තිබුණේද යන බව.

(ඊ) පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම පදනම් කරගෙන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර තිබුණේද යන බව.

(උ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණේද යන බව, සහ

(ඌ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූල වූයේද යන බව.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, මා දරන්නාවූ මතය වනුයේ,

(අ) 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව 2015 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව,

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ අරමුණු සඳහා උපයෝජනය කර තිබුණු බව,

(ඇ) ණය ගිවිසුමේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුකූලව ප්‍රතිපූර්ණය සඳහා වූ ඉල්ලුම්පත් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කරන ලද වියදම් ප්‍රකාශ (විප්‍ර) කෙරෙහි සාධාරණ ලෙස විශ්වාසය තැබිය හැකි බව, සහ

(ඈ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීමට කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බව, සහ

(ඉ) ණය ගිවිසුමේ දක්වා ඇති මූල්‍ය සම්මුතීන්වලට අනුකූලවූ බවත්ය.

## 3. මූල්‍ය හා භෞතික කාර්යසාධනය

## 3.1 අරමුදල් උපයෝජනය

ලබාගත හැකිවූ තොරතුරු අනුව, ව්‍යාපෘති මූල්‍යයනය, අයවැයගත ප්‍රතිපාදනය සහ සමාලෝචිත වර්ෂය තුළ සහ 2015 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය පිළිබඳ වැදගත් සංඛ්‍යා ලේඛන කිහිපයක් පහත දැක්වේ.

| ප්‍රභවය | ණය ගිවිසුම අනුව මූල්‍යයනය සඳහා එකඟ වූ මුදල | | සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ඇස්තමේන්තුවේ කරන ලද වෙන්කිරීම | උපයෝජනය කළ අරමුදල් - සමාලෝචිත වර්ෂය තුළ | | උපයෝජනය කළ අරමුදල් - 2015 දෙසැම්බර් 31 දිනට | |
|---|---|---|---|---|---|---|---|
| | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන | රු. මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන | කුවේට් ඩිනාර් මිලියන | රු.මිලියන |
| කුවේට් අරමුදල | 3.00 | 1,421.57 | 410.00 | 0.85 | 404.42 | 1.36 | 644.49 |
| ශ්‍රීලංර | 0.50 | 238.48 | 60.00 | 0.11 | 52.47 | 0.20 | 95.97 |
| | 3.50 | 1,660.05 | 470.00 | 0.96 | 456.89 | 1.56 | 740.46 |

ඉහත තොරතුරු අනුව, රු.මිලියන 1,421.57 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 3.0 ක් වූ වෙන් කිරීමෙන් සියයට 45 ක් නියෝජනය වන රු.මිලියන 644.49 කට සමාන කුවේට් ඩිනාර් මිලියන 1.36 ක් පමණක් ව්‍යාපෘති කාල පරිච්ඡේදයෙන් සියයට 62 ක් ඉකුත්වීමෙන් පසුව උපයෝජනය කර තිබූ බව අනාවරණය විය. එයින් පෙනීයන්නේ ව්‍යාපෘතිය විසින් එහි කටයුතු ඉතිරිවී ඇති වර්ෂ 2 ක කාල පරිච්ඡේදය තුළ කඩිනම් කිරීමට ක්‍රියාමාර්ග නොගතහොත් ව්‍යාපෘතිය සඳහා වෙන්කර ඇති අරමුදල් උපයෝජනය කිරීමට නොහැකි වන බවයි.

## 3.2 භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ ආරම්භක වැඩ සැලැස්ම අනුව අග්නි දිග විශ්වවිද්‍යාලයේ ගොඩනැඟිලි 08 ක් ඉදිකිරීම සඳහා අපේක්ෂා කර තිබුණි. ඉන් ඔලුවිල් හා සම්මන්තුරෙයි ශිෂ්‍ය නේවාසිකාගාර, අධ්‍යයන වැඩ සටහන් මධ්‍යස්ථානය හා සේවක නිල නිවාස ඉදිකිරීම් වැඩ 2016 සැප්තැම්බර් 30 දිනට නිම කර තිබුණි. භූ ජල විද්‍යා රසායනාගාරය, පොදු ආපන ශාලාව හා ක්‍රීඩාගාරය දිගු කිරීම් හා ක්‍රීඩා පිට්ටනිය සඳහා වූ ඉදිකිරීම්

වැඩ පිළිබඳ භෞතික ප්‍රගතිය 2016 සැප්තැම්බර් 30 දිනට සියයට 85 සිට සියයට 98 දක්වා ප්‍රමාණයක පැවති අතර ශ්‍රවනාගාරය ඉදිකිරීම් වැඩ වල භෞතික ප්‍රගතිය සියයට 10 ක ප්‍රමාණයේ පැවතුණි.

**3.3 කොන්ත්‍රාත් පරිපාලනය**

**------------------------**

පහත නිරික්ෂණයන් කරනු ලැබේ.

(අ) ගල්කිස්සේ පිහිටි අග්නි දිග විශ්වවිද්‍යාලයේ අධ්‍යයන වැඩසටහන් මධ්‍යස්ථානයේ ශ්‍රවනාගාරයේ ඉදිකිරීම් වැඩ සඳහා මුල් සැලසුම් විධිමත් අනුමැතියකින් තොරව පසුව වෙනස් කර තිබුණි.

(ආ) ව්‍යාපෘතියේ ආරම්භක අදියරේදී පිළියෙල කරන ලද විස්තරාත්මක ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ සැලැස්ම අවස්ථා 02 කදී සංශෝධනය කර තිබුණි. එබැවින් 2015 දෙසැම්බර් 31 දිනට පෙර නිම කිරීමට අපේක්ෂා කරන ලද ඉදිකිරීම් වැඩ පිළිබඳ කාල පරිච්ඡේදය සංශෝධනය කර දීර්ඝ කර තිබුණි. තවද 2014 ජූලි මාසයේදී ආරම්භ කිරීමට අපේක්ෂා කර තිබු පොදු ආපන ශාලාවව, ක්‍රීඩා පිට්ටනිය හා ක්‍රීඩාගාරය ආදි ඉදිකිරීම් වැඩ මාස 12 ක ප්‍රමාදයක් සහිතව 2015 ජූලි මාසයේදී ආරම්භ කර තිබුණි.

(ඇ) ඉහත කරුණු වලට අමතරව, 2014 වර්ෂයේදී සංශෝධනය කරන ලද වැඩ සැලැස්මට ඇතුළත් නොකරන ලද ශ්‍රවණාගාරයේ ඉදිකිරීම් වැඩ සඳහා කොන්ත්‍රාත්තු සැලකිය යුතු ප්‍රමාදයන් සහිතව ව්‍යාපෘතිය විසින් 2016 අප්‍රේල් 26 දින ප්‍රදානය කර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස , ව්‍යාපෘතියේ කාල පරිච්ඡේදය 2017 දෙසැම්බර් 31 දක්වා දීර්ඝ කර තිබුණි. කොන්ත්‍රාත්තුව නියමිත කාලයට ප්‍රදානය කළේ නම්, දරන ලද ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ පිරිවැය අඩු කර ගත හැකිව තිබූ බව විගණනයේදී නිරික්ෂණය විය.

**3.4 මතභේදයට තුඩුදෙන කරුණු**

**-----------------------------**

ව්‍යාපෘති ගිවිසුමේ වගුව 02 යටතේ යෝජනා කරන ලද උපකුලපති නිවස, අමුත්තන්ගේ නිවාසය, සංස්කෘතික කටුගෙය හා කළමනාකරණ හා වාණිජ පීඨය සඳහා ගොඩනැඟිලි ඉදිකිරීම් වැඩ විධිමත් අනුමැතියකින් තොරව 2013 ඔක්තෝබර් 08 දින පැවති මෙහෙයුම් කමිටුවේ තීරණය පදනම් කර ගෙන නවතා දමා තිබුණි.